චක්‍රලේඛ අංක :- 15/2005 ( 11 )

මගේ අංකය :- බ.ප./ස.සේ.කො.ස/ලේ.
සමුපකාර සේවක කොමිෂන් සභාව ( බ. ප.
අංක 121/3, තිරුළපන මාවත,
කොළඹ 05.
2009. 12. /07

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිතිවල
සහ බැංකු සංගම්වල ද , ස. ණ. ස. සමිතිවල ද
සභාපතිවරුන් වෙත.

## විනය පරීක්ෂණවල දී ගෙවීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 15/ 2005, 15/2005 (1) චක්‍රලේඛ කෙරෙහි කාරුණික අවධානය යොමු කරමි.

02. 15/ 2005 (1) චක්‍රලේඛය මගින් සංශෝධනය කරන ලද කාර්ය විධිවිධාන සංග්‍රහයේ 5 : 10 : 03වගන්තිය පහත සඳහන් අයුරින් නැවතත් සංශෝධනය කරනු ලැබේ.

5 : 10 : 03 – ඉහත සඳහන් දීමනාවට අමතරව අභියාචනා පරීක්ෂණ නිලධාරියා / විනය පරීක්ෂණ නිලධාරියා / මෙහෙයවන නිලධාරියා රජයේ හෝ සංස්ථා සේවයේ විශ්‍රාමිකයෙකු නම් ඔහු විශ්‍රාම යන විට දැරූ තනතුර පදනම් කර ගෙන ද රජයේ හෝ සංස්ථා සේවයේ දැනට සේවයේ යෙදී සිටින නිලධාරියෙකු නම් ඔහු දරණ තනතුර පදනම් කරගෙන ද රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත. අභියාචනා පරීක්ෂණ නිලධාරියා / පැමිණිලි මෙහෙයවන නිලධාරියා / විනය පරීක්ෂණ නිලධාරියා සමුපකාර සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු නම් ඔහු විශ්‍රාම යනවිට දැරූ තනතුර පදනම් කරගෙන ද දැනට සමුපකාර සේවයේ නියුතු නිල ධාරියෙකු නම් ඔහු දරණ තනතුර පදනම් කරගෙන ද සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.

අයි. ආර්. සෝමසිරි,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :-

1. බස්නාහිර පළාතේ සමුපකාර , හා ප්‍රවාහන අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්,
2. ලේකම්, ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය ( බ.ප )
3. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් ( බ. ප )
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ( කොළඹ / කළුතර / ගම්පහ )